# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,714 - 2011 ජූලි මස 08 වැනි සිකුරාදා - 2011.07.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | 984 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | 985 |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 986 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | 990 |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 993 |
| විවිධ දැන්වීම් ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2011 ජූලි මස 15 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2011 ජූලි මස 01 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2011 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

983- B 080239—8,860 (2011/07)

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## මහාධිකරණය -මාතර

මාතර මහේස්ත්‍රාත් අධිකරණය, තංගල්ල දිසා මහේස්ත්‍රාත් අධිකරණය හා වලස්මුල්ල දිසා මහේස්ත්‍රාත් අධිකරණය මගින් රාජ සන්තක කරන ලද පහත සඳහන් කරනු ලබන රථ වාහන විකිණීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබේ.

### මාතර මහේස්ත්‍රාත් අධිකරණය

| *වාහන ලියාපදිංචි අංකය* | *වෙළඳ නාමය* | *වාහන වර්ගය* | *ඇප තැන්පතුව රු. ශ.* |
|---|---|---|---|
| 01. 24ශ්‍රී 0087 | මොරිස් | ලොරි රථය | 5000 |
| 02. 26 ශ්‍රී 3817 | ටාටා | ලොරි රථය | 2000 |
| 03. 68-5979 | ඉසුසු | ට්‍රිපර් රථය | 5000 |
| 04. 40 ශ්‍රී 7080 | ඉසුසු | ලොරි රථය | 5000 |
| 05. N. W. G. Z. 6850 | ටොයොටා | ට්‍රක් රථය | 5000 |

### තංගල්ල දිසා මහේස්ත්‍රාත් අධිකරණය

| *වාහන ලියාපදිංචි අංකය* | *වෙළඳ නාමය වර්ගය* | *වාහන* | *ඇප තැන්පතුව රු. ශ.* |
|---|---|---|---|
| S. P. L. G. 6066 | ටොයොටා | ප්‍රිසර් ට්‍රක්රථය | 10000 |

### වලස්මුල්ල දිසා මහේස්ත්‍රාත් අධිකරණය

| *වාහන ලියාපදිංචි අංකය* | *වෙළඳ නාමය වර්ගය* | *වාහන වර්ගය* | *ඇප තැන්පතුව රු. ශ.* |
|---|---|---|---|
| 40 ශ්‍රී 8372 | ඉසුසු | ලොරිරථය | 5000 |

ඉහත සඳහන් කරන ලද රථ වාහන විකිණීම සඳහා මුද්‍රා තැබූ ටෙන්ඩර් 2011 අගෝස්තු 02 වැනි දින පෙ.ව. 11.00 දක්වා මා විසින් භාරගනු ලැබේ.

(1) සතියේ කාර්යාල දිනයන්හි පෙ.ව. 10.00 සිට ප.ව. 3.00 දක්වා අදාල අධිකරණ කාර්යාල භූමියේදී මෙම වාහන පරීක්ෂා කළ හැකිය.

(2) ආපසු ගෙවනු ලබන ටෙන්ඩර් තැන්පතු ගාස්තුව ඉහතින් දැක්වෙන පරිදි සහ ආපසු නොගෙවන ටෙන්ඩර් පෝරම ගාස්තු රු. 100ක මුදල තැන්පත් කිරීමෙන් 2011.07.08 දින සිට 2011.08.01 දින ප.ව. 3.00 දක්වා මාතර මහාධිකරණයෙන් ටෙන්ඩර් පත් ලබාගත හැකිය.

(3) මුද්‍රා තබන ලද ටෙන්ඩර් 2011.08.02 දින පෙ.ව. 11.00 ට පෙර මෙම කාර්යාලයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය හැකිය. ගෙනවිත් භාර දෙන්නේ නම් කළාප ගණකාධිකාරී ඉදිරියේ තැන්පත් කර ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය හැකිය.

(4) ටෙන්ඩර් බහා එවන ලියුම් කවරයේ උඩ වම් කෙළවරේ "වාහන සඳහා මිළ ගණන් 2011' යනුවෙන් සඳහන් කළ යුතුය.

(5) ටෙන්ඩර් විවෘත කිරීම 2011.08.03 දින ප.ව. 2.00 ට මාතර මහාධිකරණයේදී සිදු කෙරේ. මෙම අවස්ථාවට ටෙන්ඩර්කරුවන්ට හෝ ඔහුගේ නියෝජිතයෙකුට සහභාගී විය හැක.

(6) සාර්ථක ලංසුකරුවන් විසින් දින 07 ඇතුලත ඉදිරිපත් කරන සම්පූර්ණ මුදල ගෙවා වාහන රැගෙන යායුතු අතර එසේ කිරීමට අපොහොසත් වුවහොත් ආපසු ගෙවන තැන්පතුව අහිමි කරනු ලැබේ.

(7) අනුමත ආකෘති පත්‍රයෙන් තොරව විස්තර සඳහන් ප්‍රකාශනයේ කොන්දේසි ප්‍රකාරව නොවන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලබන අතර ඒ සඳහා කරනු ලබන කිසිදු ඉල්ලීමක් සලකා බලනු නොලැබේ.

(8) එක් ටෙන්ඩර් පත්‍රයක් මගින් මිලගණන් ඉදිරිපත් කල හැක්කේ එක් වාහනයක් සඳහා පමණි.

(9) ටෙන්ඩර් පත්‍රවල කරනු ලබන සියලුම වෙනස් කිරීම් හා මැකීම් වලට ටෙන්ඩර්කරු විසින් ස්වකීය කෙටි අත්සන යෙදිය යුතුය.

(10) ටෙන්ඩර් අයදුම්පත්‍රය සමග මුදල් ගෙවූ කුවිතාන්සියේ ඡායා පිටපතක් ඇමිණිය යුතුය.

(11) ටෙන්ඩර් මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

සිසිර කුමාර රත්නායක,
මහාධිකරණ විනිසුරු,
මාතර.

2011 ජූනි මස 20 වැනි දින,
මාතර මහාධිකරණයේ දී ය.

07-159

---

## ශ්‍රී ලංකා දුම්රිය සේවය

### ලංසුකරුවන්ට කරනු ලබන ආරාධනය

අයිතම 01- 20 M/T ගර්හිත (රේඩියේටර්) හා
අයිතම 02-15 M/T ගර්හිත දඟර දුනු (කොයිල් ස්ප්‍රිං) ඉවත් කිරීම සඳහා වූ ප්‍රසම්පාදනය

(1) කොළඹ 10, ඕල්කට් මාවතේ ශ්‍රී ලංකා දුම්රිය සේවයේ දුම්රිය මූලස්ථානයේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (ප්‍රධාන) සභාපති තැන විසින් අයිතම 01-20 දක්වාවූ M/T ගර්හිත M/T (රේඩියේටර්) හා අයිතම 02-15 දක්වා වූ M/T දඟර දුනු (කොයිල් ස්ප්‍රින්) ඉවත් කිරීම සඳහා වූ ප්‍රසම්පාදනය

(2) 2011.06.29 දින ප.ව. 2.00 ට ලංසු භාර ගැනීම අවසන් කෙරේ.

(3) යලි ආපසු නොගෙවන රු. 2500.00 ක ලියවිලි ගාස්තුවක් දුම්රිය සේවයේ ප්‍රධාන ගණකාධිකාරී කාර්යාලය වෙත ගෙවීමෙන් 2011.06.24 දින ප.ව. 3.00 දක්වා, කොළඹ 10, දුම්රිය ගබඩා අධිකාරී තැනගේ කාර්යාලයෙන් ලබාගන්නා ලංසු ආකෘතිපත් මත පමණක් සකස් කළ ලංසු ඉදිරිපත් කළ යුතුයි. ලංසු ලියවිලි පරීක්ෂාව ගාස්තුවකින් තොරව කළ හැක.

(4) ලංසු භාරගැනීම අවසන් කළ වහාම කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය සේවා මූලස්ථානයේදී ඒවා විවෘත කරනු ලැබේ. ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ට, මෙම ලංසු විවෘත කරන අවස්ථාවට පෙනී සිටින ලෙස ආරාධනා කරමු.

(5) මුද්‍රා තබන ලද ලංසු පහත සඳහන් ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් යොමුකිරීම හෝ ගෙනැවිත් භාරදීම කළ හැක.

සභාපති තැන, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන), ශ්‍රී ලංකා දුම්රිය සේවය, දුම්රිය මූලස්ථානය, ඕල්කට් මාවත, කොළඹ 10.

(6) කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේදී, ගාස්තුවකින් තොරව ලංසු ලියවිලි පරීක්ෂා කර බැලිය හැක.

(7) වැඩිමනක් විස්තර සඳහා කොළඹ 10, දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුවේ, දුම්රිය ගබඩා අධිකාරී (දුරකථන අංක 2436818, 2432044) අමතන්න.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

07-177

---

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

## හම්බන්තොට දිස්ත්‍රික්කය - රා රේන්ද විකිණීම 2012

2012 ජනවාරි මස 01 වැනි දින සිට 2012 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ පහත උපලේඛනයේ විස්තර සඳහන් රා තැබෑරුමේ පැසුණු රා සිල්ලරට විකිණීම සඳහා 1982.08.20 දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද රා රේන්ද විකිණීමේ කොන්දේසිවලට හා පොදුවේ සෑම සුරාබදු බලපත්‍රයක් ම වෙනුවෙන් දැනට බලපවත්නා හා ඉදිරියට බලපැවැත්විය හැකි කොන්දේසිවලට යටත් ව හම්බන්තොට දිස්ත්‍රික්කයේ පිහිටි අංක 01 දරන රා තැබෑරුම සඳහා ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

02. ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් රු. 5000 ක් ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට තැන්පත් කර ලබා ගත් නියමිත පෝරමය ඉදිරිපත් කළ යුතුය. තවද ටෙන්ඩර්කරු විසින් පහත සඳහන් *ගැසට් නිවේදනයේ* පරිදි වත්කම් සහිත සහතික ටෙන්ඩර්කරුගේ නිශ්චල දේපළ පිහිටි ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගෙන ටෙන්ඩර් පත්‍රයට ඇමිණිය යුතුයි.

03. සෑම ටෙන්ඩරයක් ම ටෙන්ඩර්කරුගේ නමින් ඉදිරිපත් කළ යුතුය. නියෝජිතයෙකු විසින් හෝ ලාංකික නොවූ හා 1982.08.20 දින අංක 207 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද 1982 වර්ෂයේ රා රේන්ද විකිණීමේ කොන්දේසි යටතේ නුසුදුසු වන්නන්ගේ ටෙන්ඩර් පත්‍ර භාර ගනු නොලැබේ.

04. මෙම තැබෑරුම වෙනුවෙන් එක් අයෙකු විසින් එක් ටෙන්ඩරයකට වඩා ඉදිරිපත් කළ නොහැකි අතර, පස්දෙනෙකුට වඩා හවුල් වන ටෙන්ඩර් පත්‍ර ද ඉදිරිපත් කල නොහැක.

05. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම කවරයක බහා සීල් තබා කවරයේ වම් පස මුදුනේ "හම්බන්තොට දිස්ත්‍රික්කයේ අංක 01 දරන රා තැබෑරුමේ රේන්ද සඳහා ටෙන්ඩර් - 2012" යනුවෙන් පැහැදිලි ලෙස සඳහන් කළ යුතුය. ටෙන්ඩර් සහිත කවරය හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් හෝ ලියාපදිංචි තැපෑලෙන් 2011.08.05 වැනි දින පෙ.ව. 10.00 ඉකුත් වීමට පෙර ලැබෙන සේ ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් වසන වේලාවේ දී සියලුම ටෙන්ඩර්කරුවන් හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පැමිණ සිටිය යුතුයි.

06. සාර්ථක වූ ටෙන්ඩර්කරු විසින් ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දැන් වූ විට රේන්දය විකිණීමේ කොන්දේසිවලට අත්සන් කර හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් විසින් ඇප තැන්පත් වශයෙන් නියම කරනු ලබන මුදලක් ගෙවිය යුතුයි.

07. ටෙන්ඩර් පත්‍රයේ හෝ සියලුම ටෙන්ඩර් පත්‍ර හෝ නියමිත හේතුන් නොදක්වා ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ බලය හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් වෙත පැවරී ඇත.

08. කිසියම් හේතුවක් නිසා ටෙන්ඩර් භාර ගැනීමට නියමිත 2010.08.05 වැනි දිනට අවලංගු කිරීමට සිදුවුවහොත් නැවත ටෙන්ඩර් භාර ගන්නා දිනය 2011.09.30 වැනි දින වේ.

09. වැඩි විස්තර හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් දැන ගත හැකිය.

ගනේෂ අමරසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
හම්බන්තොට.

2011 ජුනි මස 16 වැනි දින,
හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

උපලේඛනය

**2012 වර්ෂයට හම්බන්තොට දිස්ත්‍රික්කයේ අනුමත කරන ලද රා තැබෑරුම**

| අනුක්‍රමික අංකය | කොට්ඨාසය | ග්‍රාමය | ටෙන්ඩර්පත් භාර ගැනීම | තැබෑරුම විවෘතව තැබිය යුතු වේලාවන් |
|---|---|---|---|---|
| 01 | හම්බන්තොට | හම්බන්තොට | 2011.08.05 පෙ.ව. 10.00 | පෙ.ව. 11.00 සිට ප.ව. 2.00 දක්වා සහ ප.ව. 5.00 සිට ප.ව. 8.00 දක්වා |

07-136

# රජයේ නොවන දැන්වීම්

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම 2011 ජූනි මස 07 වැනි දින සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : රිනිව් ලංකා (ඇපයෙන් සීමිත) සමාගම
සමාගමේ අංකය : ජී. එල්. 2144
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 732 2/1, මරදාන පාර, කොළඹ 10.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

බිස්නස් සොලූෂන්ස් ඇන්ඩ් සෙකට්‍රීස් (පුද්ගලික) සමාගම.

07-236

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම 2011 ජූනි මස 13 වැනි දින සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : වෝල්ටේජ් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී. වී. 79388
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 28 /සී, කින්රෝස් ඇවනිව්, කොළඹ 04

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

බිස්නස් සොලූෂන්ස් ඇන්ඩ් සෙකට්‍රීස් (පුද්ගලික) සමාගම.

07-235

---

### 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය යටතේය

අංක 431, පරණ කැස්බෑව පාර, උඩහමුල්ල, නුගේගොඩ දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටි පී. වී. 78285 දරන සමාධි රිසෝට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන සමාගම 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ 2011 අප්‍රේල් මස 08 වැනි දින ස්ථාපනය කරන ලද බව දැනුම් දීමයි.

අධ්‍යක්ෂවරු.

07-202/1

### 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය යටතේය.

අංක 25, ග්‍රිල්ෆඩ් ක්‍රිසන්ට්, කොළඹ 07 දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටි පීවී 79431 දරන ක්ලැමෙන්ඩර් සිලෝන් ඩිවලොප්මන්ට් (පීවීටී) එල්ටීඩී යන සමාගම 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ 2011 ජූනි මස 16 වැනි දින ස්ථාපනය කරන ලද බව දැනුම්දීමයි.

අධ්‍යක්ෂවරු.

07-202/2

---

### දැනුම්දීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව කැන් වෙන්චර්ස් (පීවීටී) එල්ටීඩී 2011 ජූනි 06 වැනි දින ලියාපදිංචි කරන ලදී.

සමාගමේ නම : කැන් වෙන්චර්ස් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී. වී. 79251
ලියාපදිංචි දිනය : 2011 ජූනි 06
ලියාපදිංචි ලිපිනය : අංක 39/5, කලල්ගොඩ පාර, කලල්ගොඩ, පන්නිපිටිය.

සමාගම් ලේකම්.

07-189

---

### දැනුම් දීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව අමාෂු ට්‍රේඩිං (ප්‍රයිවට්) ලිමිටඩ් 2011 ජූනි 07 වැනි දින ලියාපදිංචි කරන ලදී.

සමාගමේ නම : අමාෂු ට්‍රේඩිං (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 79264
ලියාපදිංචි දිනය : 2011 ජූනි 07
ලියාපදිංචි ලිපිනය : අංක 129ඩී, දම්පේ, මීගොඩ

සමාගම් ලේකම්.

07-188

## නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(2) වගන්තිය ප්‍රකාර මෙසේ දැනුම් දෙනු ලැබේ.

සමාගමේ මීට ප්‍රථම නම : මල්ටි ෆිනෑන්ස් ලිමිටඩ්
සමාගමේ අංකය : පී. බී. 891
ලියාපදිංචි ලිපිනය : අංක 281, ආර්. ඒ. ද මැල් මාවත, කොළඹ 03.
සමාගමේ නව නාමය : මල්ටි ෆිනෑන්ස් පීඑල්සී

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

අධ්‍යක්ෂ.

2011 ජුනි 17 වැනි දින.

07-222

---

## නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ නිවේදනයයි

සමාගමේ නම : පවුන්ඩේෂන් ෆෝ ඉනොවේටිව් සොෂල් ඩිවලොප්මන්ට් ලිමිටඩ්
සමාගමේ අංකය : GL2143
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : 57, දහම් මාවත, මොරටුව
සංස්ථාගත කිරීමේ දිනය : 2011.06.07

බ්‍රිලියන්ට් ප්‍රොමෝටර්ස් ඇන්ඩ් කන්සල්ටන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.
ලියාපදිංචි ලේකම්වරු.

07-214

---

## නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ නිවේදනයයි

සමාගමේ නම : වයිල්ඩ් රයිට්ස් ඇඩ්වොකෙසි නෙට්වර්ක්
සමාගමේ අංකය : GA2549
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : 58A, හෝටන් ප්ලේස්, කොළඹ 07
සංස්ථාගත කිරීමේ දිනය : 2011.05.13

බ්‍රිලියන්ට් ප්‍රොමෝටර්ස් ඇන්ඩ් කන්සල්ටන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලියාපදිංචි ලේකම්වරු.

07-213

---

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

පන්නිපිටිය, පැලැන්වත්ත, අංක 325/11 දරන ස්ථානයෙහි පදිංචි, තල්ගහ හේනගේ ලක්මාලි චම්පා ප්‍රනාන්දු වන මා විසින්, පන්නිපිටිය, පැලැන්වත්ත, අංක 325/11 දරන ස්ථානයේ පදිංචි හෙට්ටිආරච්චිගේ ඉරේෂා එරංගි යන අය වෙත, සයිප්‍රසයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ කළමනාකාර ඩෙස්පිනා කන්ස්තන්තිනෝ විසින් 2010.09.28 දින සහතික කරන ලද ඇටෝර්නි බලපත්‍රයෙන් ප්‍රදානය කරන ලද ඇටෝර්නි බලය, අද දින සිට ප්‍රත්‍යාදිෂ්ඨ කොට අවලංගු කරන ලද බවත්, එම ඇටෝර්නි බලය යටතේ මින් ඉදිරියට ක්‍රියාත්මක කරනු ලබන්නාවූ මොනයම් ක්‍රියාවකට හෝ කටයුත්තකට හෝ මගේ කිසිදු වගකීමක් හෝ බැඳීමක් නොමැති බවත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට සහ එහි මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

තල්ගහ හේනගේ ලක්මාලි චම්පා ප්‍රනාන්දු.

2011.06.18

07-145

---

## ඇටර්නි බලය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කලින්, හෝමාගම, හබරකඩ, බෝධිරාජ මාවත, අංක 387/14 හි පදිංචිව සිට දැනට ඕස්ට්‍රේලියාව, 4350 ක්වීන්ස්ලන්ඩ්, ටුවූම්බා, රොසෙල්ලා ස්ට්‍රීට්, අංක 19 හි පදිංචි කුසුම් චන්ද්‍ර ශ්‍රී විජය වන්නිආරච්චි වන මම පී. ජේ. එම්. කුමාරසිරි ප්‍රසිද්ධ නොතාරිස් ලියා සහතික කළ අංක 769 හා 2002.04.18 දිනැති සාමාන්‍ය ඇටර්නි බලකරය මගින් හෝමාගම, හබරකඩ, බෝධිරාජ මාවත, අංක 387/14 හි පදිංචි සිසිරනාත් ශ්‍රී විජය වන්නිආරච්චි යන අයට දුන් කාණ්ඩ අංක 236, පත්‍රිරු අංක 118 සහ දිනපොත් අංක 3691 යටතේ ලියාපදිංචි කළ ඇටර්නි බලය මෙයින් නීත්‍යානුකූල ලෙස අවලංගු කරනු ලැබේ.

කුසුම් චන්ද්‍ර ශ්‍රී විජය වන්නිආරච්චි,
ඇටර්නි අධිපති.

07-169

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතෙහි 9(2) වගන්තියට අනුව පහත සඳහන් සමාගමෙහි නම 2011 ජුනි 06 වැනිදා සිට ක්‍රියාත්මකවන පරිදි වෙනස් කර ඇති බව මෙයින් දන්වා සිටිමු.

සමාගමේ පැරණි නාමය : ඩයලොග් බිස්නස් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : PV76675
සමාගමේ ලියාපදිංචි කළ කාර්යාලයීය ලිපිනය : නො. 234, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.
සමාගමේ නව නාමය : ෆස්ට්සෝස් - ඩයලොග් සොලූෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

ෆස්ට්සෝස් - ඩයලොග් සොලූෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්.

2011 ජුනි මස 23 වැනි දින.

07-178

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වැනි ඡේදයට අනුව පහත සඳහන් සමාගම ලියාපදිංචි කළ බව දන්වමු.

සමාගමේ නම : ට්‍රේඩ් ස්මාර්ට් (පුද්ගලික) සමාගම
සමාගමේ ලියාපදිංචි අංකය : PV 78103
සමාගම ලියාපදිංචි කළ දිනය : 2011.03.31
ලියාපදිංචි ලිපිනය : අංක 08, පොල්වත්ත, පන්නිපිටිය

අමාලි ප්‍රියභාෂිණී,
සමාගම් ලේකම්.

07-208

---

### 2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

සමාගමේ නම : ඉන්ඩොෆිල් ලංකා ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ්
අංකය : පී වී 79370
දිනය : 2011.06.17
ලියාපදිංචි ලිපිනය : අංක 172, අළුත්කඩේ වීදිය, කොළඹ 12
සමාගමේ ලේකම් : සී. පාලිත ජේ. ඩබ්ලිව් මැතිව් එස්ආර්සී/1159/94

සී. මැතිව් සහ කො. (පුද්ගලික) සමාගම.

07-209

---

### දැන්වීමයි

2007 සමාගම් ලියාපදිංචි කිරීමේ පනතේ අංක 07 දරන ඡේදය අනුව මහජනයා වෙත කරන නිවේදනයයි

සමාගමේ නම : කැබිල්ලදොව හයිඩ්‍රෝපවර් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පීවී 78039
ලියාපදිංචි ලිපිනය : අංක 141/7, වොක්ෂොල් වීදිය, කොළඹ 02.

සමාගම් ලේකම්.

07-180

---

### දැන්වීමයි

2007 සමාගම් ලියාපදිංචි කිරීමේ පනතේ අංක 07 දරන ඡේදය අනුව මහජනයා වෙත කරන නිවේදනයයි

සමාගමේ නම : ස්කැන්ඩිනේවියන් කන්සල්ටන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පීවී 78149
ලියාපදිංචි ලිපිනය : නො 119, හැටන් පාර, පෙරගහමුල, ගිනිගත්හේන.

සමාගම් ලේකම්.

07-181

---

### නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(2) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගමේ නම වෙනස් කිරීම පිළිබඳව අප විසින් මෙයින් නිවේදනය කර සිටිමු :-

සමාගමේ කලින් නම : කැපිටල් රීච් බිස්නස් ඩෙවලොප්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 6869
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : අංක 1, ලේක්ක්‍රෙසන්ට් කොළඹ 02
සමාගමේ අලුත් නම : සොප්ලොජික් ඉන්ෂුරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

සමාගම සඳහා සහ වෙනුවෙන්,

ජීඩබ් කෝපරේට් සෙක්‍රටේරියල් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරුන්.

07-187/1

---

### වගකීමෙන් සීමිත සමාගමක් සංස්ථාගත කිරීම පිළිබඳ ප්‍රසිද්ධ නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කිරීම පිළිබඳව අප විසින් මෙයින් නිවේදනය කර සිටිමු.

සමාගමේ නම : රීච් ඒෂියා ලෙෂර් ලිමිටඩ්
සමාගමේ අංකය : පීබී 4721
සංස්ථාගත කිරීමේ දිනය : 2011.06.06
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : 40/8පී, ජැස්මින් පාර්ක්, නාරාහේන්පිට පාර, නාවල.

සමාගම සඳහා සහ වෙනුවෙන්

ජී. ඩබ්. කෝපරේට්,
සෙක්‍රටේරියල් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරුන්.

07-187/2

---

### සමාගම් ලියාපදිංචි කිරීම සඳහා වූ නිවේදනය

2007 වර්ෂයේ අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තියට අනුව පහත සඳහන් සමාගමේ ලියාපදිංචි විස්තර මෙයින් නිවේදනය කරන ලදී :-

සමාගමේ නම : ඉන්ටිග්‍රේටඩ් මැනේජ්මන්ට් කන්සල්ටන්ට්ස් ඇන්ඩ් සෙක්‍රටරීස් (පීවීටී) එල්ටීඩී
සමාගම් අංකය : පීවී 79022
සමාගම ලියාපදිංචි වූ දිනය : 2011 මැයි 26
ලියාපදිංචි වූ ලිපිනය : නො. 726/1, ගාළු පාර, ඉඩම, මොරටුව.

ඉන්ටිග්‍රේටඩ් මැනේජ්මන්ට් කන්සල්ටන්ට්ස්
ඇන්ඩ් සෙක්‍රටරීස් (පීවීටී) එල්ටීඩී,
අධ්‍යක්ෂවරු.

07-186

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් ආඥා පනත ප්‍රකාරව පහත සඳහන් සමාගම 2011 ජුනි මස 09 වැනි දින සිට ලියාපදිංචි කර ඇත :-

සමාගමේ නම : AMSAFE GLOBAL SERVICES (PRIVATE) LIMITED
ලියාපදිංචි අංකය : PV79235
ලියාපදිංචි ලිපිනය : 3 වැනි මහල, නො. 10, ගෝතමී පාර, කොළඹ 08.

ජේසී සහ සමාගම,
සමාගම් ලේකම්වරු.

අංක 9/5, තම්බයියා ඇවනියු,
කොළඹ 07.

07-146

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම 2011.04.27 දින සංස්ථාපනය කරන ලද බව නිවේදනය කරනු ලැබේ :-

සමාගමේ නම : යුනිපවර් ග්‍රීන් පාක් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පීවී 78514
ලිපිනය : 23 1/1, සිරිධම්ම මාවත, කොළඹ 10.

07-265/1

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම 2011.04.11 දින සංස්ථාපනය කරන ලද බව නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : ජේ. සී. ඉන්ටර්නැෂනල් ට්‍රේඩින් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලියාපදිංචි අංකය : පී. වී. 78334
ලිපිනය : 146/22, හැව්ලොක් පාර, කොළඹ 05.

07-265/2

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම ස්ථාපිත කළ බව මෙයින් දන්වමි :-

සමාගමේ නම : නිමාලි රාජපක්ෂ කන්ස්ට්‍රක්ෂන් ඇන්ඩ් ලෑන්ඩ් සේල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 78906
සංස්ථාගත කළ දිනය : 2011.05.19
ලිපිනය : නො. 51බී, දුනුකෙවෙල, හිරිවඩුන්න.

සමාගම් ලේකම්.

07-264

---

### නිවේදනයයි

ෂබ්රා යුනිකෝ ෆිනෑන්ස් ලිමිටඩ් PVS 5290
අධිකරණය මගින් විසුරුවා හැරීම

නඩු අංකය 205/සී.ඕ
දිසා අධිකරණය - කොළඹ

**අවසන් රැස්වීම පිළිබඳව දැන්වීම**

ඉහත නම සඳහන් සමාගමේ ණය හිමියන්ගේ අවසන් රැස්වීම 2011 අගෝස්තු මස 12 වැනි සිකුරාදා සවස 3.00 ට කොළඹ 02, වොක්ෂෝල් වීදිය, අංක 141/7A, රන්වත්ත සහ සමාගමේදී පැවැත්වෙන අතර එහි අරමුණ වනුයේ ඈවරකරුගේ අවසන් වාර්තාව උසාවියට ඉදිරිපත් කිරීම සම්බන්ධව නිර්දේශයන් සාකච්ඡා කිරීමය.

සුමිත් රන්වත්ත,
ඈවරකරු.

2011.07.08

07-150

---

### සමාගම් ස්ථාපනය කිරීමේ ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වැනි වගන්තිය ප්‍රකාර කරනු ලබන නිවේදනයයි

පහත සඳහන් සමාගම සංස්ථාපනය කර ඇති බව මෙයින් දැනුම් දෙමු:-

සමාගමේ නම : ඇන්ඩෲ විශ්වජිත් සුබසිංහ ෆවුන්ඩේෂන් (ගරන්ටි) ලිමිටඩ්
සමාගමේ අංකය : ජීඑල් 2142
ලියාපදිංචි කළ දිනය : 2011.05.30
සමාගමේ ලිපිනය : අංක 3, පන්සල පාර, මීගමුව.

කේ. එස්. සෙක්‍රටරීස් (පුද්ගලික) සමාගම - 0382240708

07-157/1

---

### සමාගම් ස්ථාපනය කිරීමේ ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාර කරනු ලබන නිවේදනයයි

පහත සඳහන් සමාගම සංස්ථාපනය කර ඇති බව මෙයින් දැනුම් දෙමු :-

සමාගමේ නම : සමනල බුක් ෂොප් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පීවී 79348
ලියාපදිංචි කළ දිනය : 2011.06.10
සමාගමේ ලිපිනය : අංක 169, ග්‍රීන්ස් පාර, මීගමුව.

කේ. එස්. සෙක්‍රටරීස් (පුද්ගලික) සමාගම - 0382240708

07-157/2

**සමාගම් සංස්ථාපනය කිරීමේ ප්‍රසිද්ධ දැන්වීම**

2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ 9(1) වැනි වගන්තිය ප්‍රකාර කරනු ලබන නිවේදනය

පහත සඳහන් සමාගම සංස්ථාපනය කර ඇති බව මෙයින් දැනුම් දෙමු

සමාගමේ නම : එන්. එස්. ෆුඩ් ඇන්ඩ් බේකර්ස් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පීවී 78735
ලියාපදිංචි කළ දිනය : 2011.05.09
සමාගමේ ලිපිනය : අංක 49, බණ්ඩාරගම පාර, මාකදන, මඩපාත, කැස්බෑව

කේ. එස්. සෙක්‍රටරීස් (පුද්ගලික) සමාගම - 038 2240708

07-157/3

**සමාගම් සංස්ථාපනය කිරීමේ ප්‍රසිද්ධ දැන්වීම**

2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාර කරනු ලබන නිවේදනය

පහත සඳහන් සමාගම සංස්ථාපනය කර ඇති බව මෙයින් දැනුම් දෙමු

සමාගමේ නම : බස්නායක එන්ටර්ප්‍රයිසස් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පීවී 78646
ලියාපදිංචි කළ දිනය : 2011.05.04
සමාගමේ ලිපිනය : අංක 91, 17 වන පටුමග, 2 වැනි පියවර, දික්හේන්පුර, හොරණ

කේ. එස්. සෙක්‍රටරීස් (පුද්ගලික) සමාගම - 038 22 40708

07-157/4

# රටබීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම්පත්

## රටබීම තැබෑරුම සඳහා රේන්ද විකිණීම - 2012 මොරටුව

රජයෙන් අනුමත කරන ලද පහත සඳහන් ප්‍රාදේශීය ප්‍රදේශයන්හි සුදුසු ස්ථානයක 2012 ජනවාරි මස 01 වැනි දින සිට 2012 දෙසැම්බර් මස 31 දින දක්වා තනි අයිතිය පිට පහත සඳහන් කොන්දේසිවලට යටත්ව රටබීම (මෙරට සාදන ලද ධාන්‍ය මත්පැන් ඇතුලුව) විකිණීම සඳහා ටෙන්ඩර්පත්‍ර භාරගනු ලැබේ.

1. 1982.08.20 දින හා අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* දැක්වෙන රටබීම තැබෑරුම් රේන්ද විකිණීම් කොන්දේසිය.
2. සුරාබදු බලපත්‍ර සම්බන්ධව දැනට පවතින පොදු කොන්දේසි.

02. පහත දැක්වෙන ස්ථානයන්ගෙන් ලබාගත හැකි නියමිත ආකෘතිපත්‍ර මාර්ගයෙන් ටෙන්ඩර්පත්‍ර එවිය යුත්තේ, රු. 5,000 ක මුදලක් තැන්පත් කළ බවට ඕනෑම ප්‍රාදේශීය කාර්යාලයකින් ලබාගත් කුවිතාන්සියක් හා අදාළ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගත් වත්කම් සහතිකයක් ද එම සහතිකයන්හි උපලේඛනයේ ඇතුලත් එසේම එම සහතික නිකුත් කිරීම සඳහා පදනම් කරගත් කිසිදු දේපළක් විකුණා නැත්නම්, එම වත්කම් සහතිකය නිකුත් කළ දින සිට අවුරුදු පහක් වලංගු වේ. රේන්ද කාලය අවසන් වීමට පෙර වත්කම් සහතිකය වලංගු කාලය අවසන් වන අවස්ථාවන්හිදී සම්පූර්ණ රේන්ද කාලය සඳහා වලංගුවන අළුත් වත්කම් සහතිකයක් ටෙන්ඩරය සමග ඉදිරිපත් කළ යුතුය :-

*(අ)* ඕනෑම ප්‍රාදේශීය කාර්යාලයකින්,
*(ආ)* කොළඹ 02, ස්ටේප්ලර් වීදිය, සුරාබදු කාර්යාලයෙන්,
*(ඇ)* කොළඹ සුරාබදු මණ්ඩල කාර්යාලය.

03. කවරයක බහා මුද්‍රා තබන ලද එක් එක් ටෙන්ඩර්පත්‍රය ඇතුළත් කවරයේ වම් කෙළවරේ මෙසේ සඳහන් කළ යුතුය. "2012 වර්ෂයේ මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 9 දරන රටබීම තැබෑරුම සඳහා ටෙන්ඩර් පත්‍රයයි." ටෙන්ඩර් පත්‍ර 2011.09.14 වැනි දින පෙ.ව. 10.30 ට පෙර ලැබෙන සේ මොරටුව ප්‍රාදේශීය ලේකම්තුමාට එවිය යුතුය.

ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් භාර ගන්නා අවසන් වේලාවේදී, මොරටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පැමිණිය යුතුය.

04. තෝරාගත් ටෙන්ඩර්කරු, ඒ මොහොතේම, ගැණුම්කරු වශයෙන් දැනුම් දෙනු ලබන අතර, නියම කරනු ලබන මුදල තැන්පත් ඇප මුදල වශයෙන් මොරටුව ප්‍රාදේශීය ලේකම්තුමාට ගෙවිය යුතුය.

05. සාර්ථක ටෙන්ඩර්කරුට, ඔහුගේ ටෙන්ඩර්පත්‍රය, පිළිගත් බව දැන්වූ විට රේන්ද විකිණීමේ කොන්දේසි අත්සන් කිරීම හෝ නියම කළ ඇප මුදල් යථා කාලයේදී තැන්පත් කිරීම හෝ පැහැර හැරියහොත් ඔහු විසින් තැන්පත් කරන ලද ටෙන්ඩර් තැන්පත් මුදල් අහිමි වන අතර, ඔහුගේ නම වරදකරුවෙකු වශයෙන්, සුරාබදු බලපත්‍ර කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ. සාර්ථක ටෙන්ඩර්කරු හෝ ලන්සුකරු විසින් හෝ සම්පූර්ණ ඇප මුදල තැන්පත් කර විකිණීමේ කොන්දේසි අඩංගු ගිවිසුම් අත්සන් කළ පසු, ටෙන්ඩර්කරුවන්ගේ ටෙන්ඩර්, තැන්පත් මුදල ආපසු ගෙවනු ලැබේ.

06. කිසි හේතුවක් නොදක්වාම, එකක් හෝ සියලුම ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීමේ බලය ප්‍රාදේශීය ලේකම්තුමාට ඇත.

07. මෙම විදේශ මත්පැන් තැබෑරුම්, කොට්ඨාස අංක 9 හි පවත්වාගෙන යා යුතුය. සාර්ථක ටෙන්ඩර්කරු විසින් කොට්ඨාසය තුළින් සුදුසු ගොඩනැගිල්ලක් සපයා ගත යුතු අතර, එකී ගොඩනැගිල්ල සඳහා සුරාබදු කොමසාරිස්ගේ අනුමැතිය ලබාගත යුතු වේ. ගොඩනැගිලි සපයා දීමට ප්‍රාදේශීය ලේකම් බැඳී නොමැති බැව් සැළකිය යුතු ය.

08. අනුමත කරන ලද රටබීම තැබෑරුම් ලැයිස්තුව පහත දැක්වේ.

| *අනුක්‍රමික අංකය (ඒ)* | *කොට්ඨාසය* | *ප්‍රාදේශීය ප්‍රදේශය තැබෑරුම අයත් විය යුතු පෙදෙස* | *තැබෑරුම විවෘත කරන වේලාව* | *තැබෑරුම වසන වේලාව* | *ටෙන්ඩරය සඳහා තැන්පත් කළ යුතු මුදල් (රු.)* | *ටෙන්ඩරය භාර ගන්නා අවසන් වේලාව* | *විකිණීම කරන දිනය* |
|---|---|---|---|---|---|---|---|
| 1 | අංක 9 කොට්ඨාසය මොරටුව මහ නගර සභාව | මොරටුව මහ නගර සභාවේ අංක 9 කොට්ඨාසයේ ගාළු පාරේ බටහිර පෙදෙසේ පිහිටි මොරටුවැල්ල ගමේ පමණක් | පෙ.ව. 11.00 ප.ව. 5.00 | ප.ව. 2.00 ප.ව. 8.00 | 5,000 | පෙ.ව. 10.30 | 2011.09.14 |

09. වැඩි විස්තර මොරටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකිය.

10. *වැදගත්* .-2011.09.14 වැනි දින විකිණීමට නොහැකි විදේශීය මත්පැන් රේන්ද 2011.11.11 වැනි දින පෙ.ව.10.30 ට නැවත විකුණනු ලැබේ.

කේ. සී. නිරෝෂන්,
ප්‍රාදේශීය ලේකම් - මොරටුව.

2011 ජූනි මස,
මොරටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.
07-249

---

**2012 වර්ෂය සඳහා කළුතර දිස්ත්‍රික්කයේ හොරණ ප්‍රාදේශීය මහ ලේකම් කොට්ඨාසයේ විදේශීය මත්පැන් රේන්දය විකිණීම**

2012 ජනවාරි මස 01 වැනි දින සිට 2012 දෙසැම්බර් 31 වැනි දින දක්වා විදේශීය මත්පැන් සිල්ලරට විකිණීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද විදේශීය මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසිවලට හා සෑම සුරාබදු බලපත්‍රයකට අදාළ එවකට පවත්වන කොන්දේසි මාලාවට යටත්ව පහත උපලේඛනයේ විස්තර දැක්වෙන විදේශීය මත්පැන් තැබෑරුම් සඳහා ටෙන්ඩර් 2011.08.09 වැනි දින පෙ. ව. 10.30 දක්වා භාර ගනු ලැබේ.

**අංක 01. හොරණ විදේශීය මත්පැන් තැබෑරුම -**

02. *(අ)* ටෙන්ඩර් තැන්පත් මුදල වෙනුවෙන් රු. 3,000ක් ඕනෑම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයක තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් සමඟ සෑම ටෙන්ඩරයක් ම ඕනෑම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයක තැන්පත් කර ලබාගත් නියමිත ටෙන්ඩර් ආකෘතිපත්‍ර මගින් දෙපිටපතකින් ඉදිරිපත් කළ යුතුය. 2011.08.08 වැනි දින ප. ව. 3.00 දක්වා ටෙන්ඩර් පෝරම නිකුත් කරනු ලැබේ.

*(ආ)* ටෙන්ඩර්කරුගේ ඉඩකඩම් ආදී නිශ්චල දේපළ පිහිටා ඇති ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගත් ටෙන්ඩර්කරුගේ වත්කම් පිළිබඳ සහතිකයක් ටෙන්ඩර් පත්‍රයට අමුණා තිබිය යුතුය. ටෙන්ඩර් සහ වත්කම් සහතික ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් යථෝක්ත විදේශීය මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවේ අඩංගුව ඇති නියමයන් විධිමත් ලෙස පිළිපැදිය යුතු බව ටෙන්ඩර් ඉදිරිපත් කරන්නන් වෙත නිවේදනය කෙරේ. ටෙන්ඩර්පත්‍ර සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර්කරුවන් පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂයෙන් සැළකිලිමත් විය යුතු ය.

(i) ටෙන්ඩර්පත්‍ර මුළුමනින්ම සම්පූර්ණ කළ යුතු ය. සඳහන් කරන මුදල ඉලක්කමෙන් පමණක් නොව අකුරින් ද ලිවීම කළ යුතු ය.

(ii) සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පෝරමවල නියමිත පරිදි සාක්ෂිකරුවන්ගේ අත්සන යොදා ඔවුන්ගේ අත්සන යොදා ඔවුන්ගේ ලිපිනයන් ද සඳහන් කර තිබිය යුතුය.

(iii) සෑම වෙනස් කිරීමක් හෝ කපා හැරීමක් ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන යොදා සහතික කර තිබිය යුතුය.

මෙම නියමයන්ට පටහැනිව ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. සෑම ටෙන්ඩරයක්ම ටෙන්ඩර්කරුගේ නමින් ඉදිරිපත් කළ යුතු අතර, නියෝජිතයකු විසින් හෝ ලාංකික නොවූ හෝ 1982.08.20 වැනි දින අංක 207 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පල කරන ලද විදේශීය මත්පැන් රේන්ද විකිණීමේ කොන්දේසි යටතේ නුසුදුසු අයගෙන් හෝ ටෙන්ඩර්පත්‍ර භාර ගනු නොලැබේ.

04. තැබෑරුම වෙනුවෙන් එක් අයකුට එක් ටෙන්ඩර් පත්‍රයකට වඩා ඉදිරිපත් කළ නොහැකි අතර, පවුලේ සාමාජිකයින් එක් තැබෑරුමක් සඳහා පස් දෙනකුට වඩා ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ නොහැකිය.

05. සෑම ටෙන්ඩරයක්ම කවරයක බහා සීල් තබා කවරයෙහි වම් කෙලවරේ අංක 01 හොරණ විදේශීය මත්පැන් තැබෑරුම් ටෙන්ඩරය 2012 යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය. විධිමත්ව සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් සහිත කවර -

*(අ)* හොරණ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන්, හෝ

*(ආ)* ලියාපදිංචි තැපෑලෙන් එවන්නේ නම් 2011..08.09 වැනි දින පෙ. ව. 10.30 වේලාවට පෙර කාර්යාලයට ලැබෙන සේ ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය හොරණ යන ලිපිනයට එවිය යුතුය. ඉහත සඳහන් වේලාවෙන් පසුව තැපෑලේ දී ප්‍රමාද වී කාර්යාලයට ලැබෙන ටෙන්ඩර් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. එම වේලාවට සියළුම ටෙන්ඩර්කරුවන් හොරණ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයට පැමිණ සිටිය යුතුය. මෙහි 3 වැනි ඡේදයේ සඳහන් රේන්ද විකිණීමේ කොන්දේසි යටතේ නුසුදුස්සකු නොවන බව ඔප්පු කිරීමට අවශ්‍ය වුවහොත් ඊට උවමනා ලියකියවිලි ද රැගෙන ආ යුතුය.

06. සාර්ථක වූ ටෙන්ඩර්කරු විසින් ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බැව් දැන්වූ වහාම රේන්ද විකිණීමේ කොන්දේසිවලට අත්සන් තබා හොරණ ප්‍රාදේශීය ලේකම් විසින් ඇප තැන්පත් මුදල වශයෙන් නියම කරනු ලබන මුදලක් ද ගෙවිය යුතුය.

07. ටෙන්ඩර්පත්‍රයක් හෝ සියළුම ටෙන්ඩර්පත්‍ර කිසිම හේතුවක් නොදක්වා ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ අයිතිය හොරණ ප්‍රාදේශීය ලේකම් වෙත පැවරී ඇත. රේන්ද විකිණීමේ කොන්දේසිවලට අනුකූල නොවන හෝ වෙනයම් අන්දමකින් නිසි පරිදි සකස් කර ඉදිරිපත් නොවූ හෝ ටෙන්ඩර් භාර ගනු නොලැබේ.

08. 2012 වර්ෂයට දැනට තැබෑරුම් පිහිටා ඇති ස්ථානය ලබාදීමට සහතික වනු නොලැබේ. දැනට විදේශීය මත්පැන් තැබෑරුම පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ල මොනයම් හේතුවක් නිසා හෝ 2012 වර්ෂය වෙනුවෙන් එම කාර්යය සඳහා නොලැබෙන්නේ නම් ඒ වෙනුවට තෝරා ගන්නා ලද අළුත් ස්ථානය විවෘත කිරීමට පෙර යෝග්‍යතාවය පිළිබඳව හොරණ ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය ලබාගත යුතු අතර, ටෙන්ඩර් ප්‍රදානය කළ දින සිට දින 30 ඇතුළත සාර්ථක ටෙන්ඩර්කරු විසින් එම ගොඩනැගිල්ල අනුමත කරවාගත යුතු ය.

09. වැඩි විස්තර හොරණ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයෙන් දැනගත හැකිය.

10. මෙම දැන්වීම අනුව 2011.08.09 වැනි දින දී මෙම රේන්දය විකිණීමට නොහැකි වුවහොත් පමණක් 2011.10.04 වැනි දින පෙ. ව. 10.30 දක්වා විකිණීම පිණිස ටෙන්ඩර් පත්‍ර භාරගනු ලබන බව ද එසේම නැවත විකිණීම ද 2011.10.04 වැනි දිනයේ දී සිදු කරන බව ද වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

කේ. ඒ. ඩී. ආර්. නිශාන්ති ජයසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
හොරණ.

2011 ජූනි මස 16 වැනි දින,
හොරණ ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

හොරණ අංක 01 දරන විදේශ මත්පැන් රේන්දය විකිණීම

| *අනු. අංකය* | *කොට්ඨාසයේ නම* | *ප්‍රාදේශීය ප්‍රදේශය* | *තැබෑරුම විවෘත කරන වේලාවන්* | *තැබෑරුම වසන වේලාවන්* | *තැබෑරුම් රේන්දය විකිණීමට ටෙන්ඩරය භාරගන්නා අවසාන දිනය හා වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු.* | *2011.08.09 දින දී විකිණීමට නොහැකි වුවහොත් නැවත විකිණීමේ දිනය හා වේලාව* |
|---|---|---|---|---|---|---|---|
| 01 | හොරණ | හොරණ නගර සභා සීමාව | පෙ. ව. 9.00 | ප. ව. 11.00 | 2011.08.09 පෙ. ව. 10.30 | 3,000 | 2011.10.04 පෙ. ව. 10.30 ට |

07-137

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## සෙලාන් බැන්ක් පීඑල්සී - පානදුර ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ පදිංචියට සුදුසු ඉතා වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

පානදුර තල්පිටි දෙබැද්ද තොටවත්ත ගමේ පිහිටි මූණමල්ගහවත්ත නමැති ඉඩමෙන් බෙදූ කොටසක් හා එහි තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු අනෙකුත් සියලු දේ. ඉඩමේ ප්‍රමාණය පර්චස් 10.

මෙම දේපළ පානදුර පදිංචි මොහොමඩ් අබ්දුල් කාදර් මොහොමඩ් ඉස්මත් වසීර් යන අය බන්ධනදායි වශයෙන් සෙලාන් බැන්ක් පී. එල්. සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*ඉඩමට පිවිසීම* .- මොරටුව විදුලි සංඥා හන්දියෙන් පැරණි ගාලු පාරට පිවිස පල්ලිමුල්ල හන්දිය දක්වා පැමිණ වමට හැරී තොටවත්ත පාරේ කි. මී. 1.3ක් පමණ තොටවත්ත මහපල්ලිය හන්දිය දක්වා ගමන්ගෙන වමට ඇති කලීෆා පාරට හැරෙන්න. මෙම පාරේ මී. 15 පමණ ගමන් ගෙන නැවත වමට හැරී සර් රසීක් ෆරීඩ් පාරට පිවිස මී. 10ක් පමණ ගිය පසු අදාළ දේපළ පාරේ දකුණු දෙසින් පිහිටා තිබේ.

2011ක් වූ අගෝස්තු මස 12 වැනි දින පෙ. ව. 11.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2007.06.01 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද 2007.04.27 වැනි දින ඩේලි මිරර්, ලංකාදීප සහ 2007.04.24 වීරකේසරී පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය* .- විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදිලින් ගෙවිය යුතු වේ.

ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), ප්‍රාදේශීය සභා වෙළඳ බද්ද හා රජය විසින් පනවනු ලබන වෙනත් බදු, වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්), නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, ලිපිකරු සහ සෝෂක වේතනය රු. 500, සියලුම ප්‍රචාරක වියදම් ද ගැණුම් මිලෙන් ඉතිරි 90% (සියයට අනූවක්) විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත දී සෙලාන් බැන්ක් පී එල් සී වෙත ගෙවා නිම කළයුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. සහකාර සමාන්‍යාධිකාරී (නීති) සෙලාන් බැන්ක් පී. එල්. සී. සෙලින්කෝ සෙලාන් ටවර් ගොඩනැගිල්ල, අංක 90, ගාලු පාර, කොළඹ 03.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වානිජ බැංකු පිලිගත් වෙන්දේසිකරු.

අංක 83/5, බෝමළුව පාර,
වටපුළුව,
මහනුවර.

දුරකථන අංක : 081- 2211025, 071-4755974, ෆැක්ස් අංකයඃ 081-2211025.

07-231

---

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - කිරුලපන ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පදිංචියට සුදුසු වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරලේ, අධිකාරි පත්තුවේ, කැළණිය ප්‍රාදේශීය සභා සීමාව තුළ (දළුගම උප කාර්යාලය) වරාකනත්ත ගමෙහි පිහිටි වරිපනම් අංක 23/9 ඒ දරන "මකුළුගහවත්ත" සහ " ඇටඹගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ටී. එම්. සී. ප්‍රනාන්දු විසින් මැන සාදන ලද 1992.09.16 දිනැති අංක 1154 දැන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් අංක 2 ප්‍රමාණයෙන් පර්චස්

දහයයි දශම නවය (අ. 0 රූ. 0 පර්. 10.9) ක් විශාල ඉඩම සහ එහි තුළ පිහිටි ගහකොළ, පළතුරු ගොඩනැගිලි ආදි සියලු ම දේ ද වේ.

මෙම දේපළ රුෂන්කා සජංගනී විජේසේකර සමරනායක ණයකරු හැටියට හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. එන්. බී. පෙරේරා විසින් සහතික කරනලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නමට ලියන ලද්දාවූ ද 2007.01.30 දින සහ අංක 2824 දරන බැදුම්කරය යටතේ ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*දේපළට පිවිසීම*.- කොළඹ සිට නුවර පාරේ කි. මී. 10ක් පමණ ගොස් දකුණට හැරී (කැළණිය විශ්වවිද්‍යාලය ඉදිරිපිට) ශාන්ත ප්‍රැන්සිස් පාරේ මීටර් 150ක් පමණ ගොස් වම් පැත්තේ ඇති ඩයස් පෙදෙසට ගොස් මීටර් 150ක් පමණ ඉදිරියට යන විට පාරේ කෙළවරේ මෙම දේපළ පිහිටා ඇත.

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙතින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් වර්ෂ 2011 ක් වූ ජූලි මස 26 වැනි දින පෙ. ව. 11.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*යෝජනා සම්මුතිය* .- 2011.06.24 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* ද, 2011.06.20 වැනි දින අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් පුවත්පත්වල පළ කර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*ගෙවීමේ ක්‍රමය*.- විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10%ක් ද (සියයට දහයක්),
2. ප්‍රාදේශීය සභා බදු සඳහා 1% (සියයට එකක්),
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්),
4. ලිපිකරු හා සෝෂක වේතනය රු. 500,
5. සියලුම ප්‍රචාරක වියදම් ද,
6. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000 ක් ද,

ගැණුම් මිලෙන් ඉතිරි 90%ක් (සියයට අනූවක්) විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත දී හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ගෙවා නිම කළ යුතු වේ. එකී 90% ඉතිරි මුදල දින 30ක් ඇතුළත දී නොගෙව්වහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට සහ එකී දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු හ වෙනත් අදාළ විස්තර සඳහා විමසන්න. ප්‍රධාන කළමණාකරු (අය කිරීම් අංශය) හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 011-2661821, 011-2661835

ඊ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස්, බලයලත් වෙන්දේසිකරු සහ තක්සේරුකරු
සාමදාන විනිශ්චයකරු. (මුළු දිවයිනටම)

*කාර්යාලය* :
අංක 25 බී, බෙල්මන්ට් වීදිය,
කොළඹ 12
දුරකථන අංක : 011-5756356,
011-2334808,
071- 8760986.

07-260

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - කළුතර ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පදිංචියට සුදුසු වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ කළුතර තොටමුන උතුරු කළුතර බැද්දේ දොඩන්ගොඩ ප්‍රාදේශීය සභා සීමාවේ සේරුපිට පිහිටි සේරුපිටවත්ත ලොට් 1 නමැති ඉඩම් කොටසට බලයලත් මානක කේ. කන්නන්ගර විසින් ලියා සහතික කරන ලද 2002.09.22 දිනැති අංක 871/2002 පිඹුරේ ලොට් 1 ඒ නමැති ඉඩමට ප්‍රමාණයෙන් පර්චස් තිස්හතර (අ. 0 රූ. 0 පර්. 34) ක් විශාල ඉඩම ගොඩනැගිලි සහ සියලුම දේත් වේ.

මෙම දේපළ උඩුපිට කංකානම්ගේ දොන් නිලන්ත චන්ද්‍රප්‍රිය ණයකරු හැටියට හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් පානදුර ප්‍රසිද්ධ නොතාරිස් පී. වී. එන්. ඩබ්. පෙරේරා විසින් සහතික කරනලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නමට ලියන ලද්දාවූ ද 2009.10.09 දින සහ අංක 2856 දරන බැදුම්කරය යටතේ ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙතින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් වර්ෂ 2011 ක් වූ අගෝස්තු මස 02 වැනි දින පෙ. ව. 11.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම*.- කළුතර හන්දියේ සිට පාලතොට පාරේ කිලෝ මීටර් 1.4ක් පමණ ගිය විට පාලතොට හන්දිය හමුවේ. එතැනින් තේක්ක වත්ත පාරේ (මෙය පන්විල කෙත්හේන පාර කියා හඳුන්වන) කිලෝ මීටර් 4.2 ක් පමණ යන විට කොහොලාන හන්දිය හමුවේ. එම හන්දියෙන් දකුණට හැරී සේරුපිට පාරේ කිලෝ මීටර් 1.7ක් පමණ යන විට මෙම දේපළට ළඟාවිය හැක. (උක්කුම් මාවත මීටර් 100)

යෝජනා සම්මුතිය .- 2011.01.14 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* ද, 2011.01.25 වැනි දින ලක්බිම, ඩේලිමිරර් සහ තිනකරන් යන පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය*.- විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10%ක් ද (සියයට දහයක්),
2. ප්‍රදේශීය සභා බදු සඳහා 1% (සියයට එකක්),
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්),
4. ලිපිකරු හා සෝෂක වේතනය රු. 500 සියලුම ප්‍රචාරක වියදම් ද,
5. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000 ක් ද,

ගැණුම් මිලෙන් ඉතිරි 90%ක් (සියයට අනූවක්) විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත දී හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ගෙවා නිම කළ යුතු වේ. එකී 90% ඉතිරි මුදල දින 30ක් ඇතුළත දී නොගෙව්වහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට සහ එකී දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර සඳහා විමසන්න. ප්‍රධාන කළමණාකරු (අය කිරීම්) හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 011-2661821, 011-2661835.

ඊ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස්, බලයලත් වෙන්දේසිකරු සහ තක්සේරුකරු
සාමදාන විනිශ්චයකරු (මුළු දිවයිනටම).

*කාර්යාලය :*
අංක 25 බී, බෙල්මන්ට් වීදිය,
කොළඹ 12
දුරකථන අංක : 011-5756356
011-2334808
071- 8760986

07-259

---

### හැටන් නැෂනල් බැන්ක් - කඩවත ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පදිංචියට සුදුසු වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ සියනෑ කෝරළයේ අධිකාරි පත්තුවේ බියගම ප්‍රාදේශීය සභා සීමාවට අයිති මාකොළ උප කාර්යාල සීමාව තුළ මාකොළ දකුණ සහ හෙයියන්තුඩුවෙහි පිහිටි හෙයියන්තුඩුව එස්ටේට් නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. එම්. පෙරේරා විසින් මැන සාදන ලද අංක 1360 සහ 1973.09.15 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් 15 ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස ප්‍රමාණයෙන් පර්චස් දහ නමයයි දශම තුන (අ. 0 රූ. 0 පර්. 19.3) ක් විශාල ඉඩම සහ ඊට අයත් සියලුම දේද වේ.

මෙම දේපළ දිසානායක මුදියන්සේලාගේ බුද්ධික බණ්ඩාර දිසානායක දිවාලප හේවගේ සුමිත් ජයලාල් සහ දිසානායක මුදියන්සේලාගේ කිරිබණ්ඩා (සඩ්‍රා රෙස්ටුරන්ට් යන නාමය හා විලාශය යටතේ හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යන) ණය කරුවන් හැටියට හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. එන්. ඒකනායක විසින් සහතික කරනලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නමට ලියන ලද 2007.07.23 දින සහ අංක 6233 දරන බැඳුම්කරය යටතේ ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙතින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් වර්ෂ 2011 ක් වූ අගෝස්තු මස 04 වැනි දින පෙ. ව. 11.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.-* කිරිබත්ගොඩ නගරයේ සිට මාකොල දෙල්ගොඩ පාරේ ගල්වල හන්දියට ගොස් දකුණට ඇති පැරකුම්බා පාරේ (තරුණ සේවා සභාව පාරේ) කිලෝ මීටර් 1ක් පමණ ගිය විට වම් අත පැත්තේ ප්‍රසිද්ධ පාරට යාබද ව පිහිටා ඇත.

*යෝජනා සම්මුතිය .-* 2011.03.11 වැනි දින *ගැසට් පත්‍රයේ* ද, 2011.03.09 ලක්බිම, ඩේලිමිරර් සහ තිනකරන් යන පුවත්පත් වලට අවධානය යොමු කරන්න.

*ගෙවීමේ ක්‍රමය.-* විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10%ක් ද (සියයට දහයක්),
2. ප්‍රදේශීය සභා බදු සඳහා 1% (සියයට එකක්),
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්),
4. ලිපිකරු හා සෝෂක වේතනය රු. 500 සියලුම ප්‍රචාරක වියදම් ද,
5. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000 ක් ද,

ගැණුම් මිලෙන් ඉතිරි 90%ක් (සියයට අනූවක්) විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත දී හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ගෙවා නිම කළ යුතු වේ. එකී 90% ඉතිරි මුදල දින 30ක් ඇතුළත දී නොගෙව්වහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට සහ එකී දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු හ වෙනත් අදාළ විස්තර සඳහා විමසන්න. ප්‍රධාන කළමණාකරු (අය කිරීම් අංශය) හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 011-2661821, 011-2661835.

ඊ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස් බලයලත් වෙන්දේසිකරු සහ තක්සේරුකරු
සාමදාන විනිශ්චයකරු (මුළු දිවයිනටම).

*කාර්යාලය :*
අංක 25 බී, බෙල්මන්ට් වීදිය,
කොළඹ 12
දුරකථන අංක : 011-5756356
011-2334808
071- 8760986

07-258

---

### හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - අම්බලන්ගොඩ ශාඛාව කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව යනුවෙන් හඳුන්වනු ලැබූ

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් පී. ඩේවිඩ් විසින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නමට ලියා සහතික කරන ලද 2007.04.24 දින සහ අංක 2888 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ගෝනපීනුවල විතානගේ හර්බට් යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී ණය මුදල් සහ ඒ මත අයවිය යුතු නෛතික පොලිය සහ වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළු සියලු මුදල් ප්‍රමාණයන් ද (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල අඩුකොට) අයකර ගැනීම සඳහා,

ඉහත කී හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී ආයතනය මා වෙත පවරා ඇති බලතල අනුව පහත විස්තර කර ඇති දේපළ වර්ෂ 2011ක් වූ අගෝස්තු මස 01 වැනි දින ප. ව. 1.30ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### උපලේඛනය

දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ වෙල්ලබඩ පත්තුවේ ගොඩගම පැපිලියගහඅඩුමුල්ල කොස්ගහ වෙල්යාය නමැති ඉඩමට බලයලත් මානක පී. එච්. ඩී. සිල්වා විසින් මැන සකස් කරන ලද 1994.10.05 වැනි දින දරන අංක 434 දරන පිඹුරේ බෙදා වෙන් කරන ලද ලොට් අංක ඒ දරන කොටස.

ප්‍රමාණය රූඩ් දෙකයි පර්චස් දොළහයි (අ. 0, රූ. 2, පර්. 12)

*පිවිසීම*.- මීටියාගොඩ සිට අළුත්වල පාරේ කොස්ගහවෙල දක්වා කි. මී. 2 1/2 පමණ ගමන් කිරීමේ දී එම පාරට යාබදව මෙම දේපළ පිහිටා ඇත.

මේ පිළිබඳ යෝජනා සම්මුතිය 2009.10.23 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ ද 2009.10.23 වැනි දින අයිලන්ඩ්, දිවයින, තිනකරන් පත්‍රවල පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය*.-වෙන්දේසිය අවසන් වනවාත් සමගම සාර්ථක ගැණුම්කරු විසින් පහත ගෙවීම් මුදලින් කළ යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. ප්‍රදේශීය සභා බදු සඳහා 1% (සියයට එකයි),
3. සියලුම ප්‍රචාරක වියදම්,
4. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් (ගැණුම් මිලෙන් 2.5%),
5. විකුණුම් කොන්දේසි පිළියෙල කිරීමේ හා නොතාරිස් ගාස්තු,
6. ලිපිකරු හා සෝෂක ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90%ක් (සියයට අනූවක්) විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත දී හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී ආයතනයට ගෙවිය යුතු අතර එසේ ගෙවීමට අපොහොසත් වුවහොත් ඒ වනවිට ගෙවා ඇති මුදල් ආපසු නොගෙවන අතර එම දේපළ නැවත වෙන්දේසියේ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු තිරප්පු පරීක්ෂාව සඳහා ජ්‍යොෂ්ඨ කළමණාකරු (ණය අයකිරීම්), හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10, දුරකථන අංක 2661826.

හේමචන්ද්‍ර දළුවත්ත,
උසාවි කොමසාරිස්, බලයලත්
වෙන්දේසිකරු සහ තක්සේරුකරු.

අංක 99, උසාවිය පාර,
කොළඹ 12.
දුරකථන අංකය : 071-4175944

07-257

---

### හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - මෝදර ශාඛාව

කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව යනුවෙන් හඳුන්වනු ලැබූ

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ආර්. ද සිල්වා විසින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී නමට ලියා සහතික කරන ලද 2004.10.01 වැනි දින අංක 1265 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ෆාතිමා මුහාර්රීසා ජාල්ඩීන් (විවාහයට පෙර බාවා) සහ මොහොමඩ් සෙයිනුඩීන් ඉක්බාල් ජාල්ඩීන් යන අයවළුන් බන්ධනදායී ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින් එකී ණය මුදල් සහ ඒ මත අයවිය යුතු නෛතික පොලිය සහ වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළු සියලු මුදල් ප්‍රමාණයන් ද (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල අඩුකර) අයකර ගැනීම සඳහා ඉහත කී හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. ආයතනය මා වෙත පවරා ඇති බලතල අනුව පහත විස්තර කර ඇති දේපළ වර්ෂ 2011 ක් වූ ජූලි මස 28 වැනි දින ප.ව. 1.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරලේ පල්ලේ පත්තුවේ කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාවට අයත් බත්තරමුල්ල ඒකකය තුළ අකුරේගොඩ පිහිටි හෝකන්දර පාරේ වරිපනම් අංක 253/23බී දරන මිල්ලගහවත්තඕවිට හෙවත් අළුබෝගහලන්ද නමැති ඉඩමට බලයලත් මානක ඩී. ඩී. හෙට්ටිගේ විසින් මැන සකස් කරන ලද 2003.06.25 වැනි දින අංක 3963 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් 'ඒ' ප්‍රමාණය පර්චස් පහලොවකි. (අ. 0, රූ. 0, පර්. 15)

*පිවිසීම*.- බත්තරමුල්ල - පැලවත්ත හන්දියේ සිට අකුරේගොඩ පාරේ කි. මී. 1 1/2 පමණ ගමන් කිරීමේ දී වම් පැත්තේ හමුවන සාම මාවතේ මීටර් 400 ක් පමණ ගමන් කිරීමේ දී වම් පැත්තේ වරිපනම් අංක 548/12 වශයෙන් මෙම දේපළ පිහිටා ඇත.

මේ පිළිබඳ යෝජනා සම්මුතිය 2009.10.30 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ ද 2009.11.04 වැනි දින අයිලන්ඩ්, දිවයින, තිනකරන් පත්‍රවල ද පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය*.- වෙන්දේසිය අවසන් වනවාත් සමගම සාර්ථක ගැණුම්කරු විසින් පහත ගෙවීම් මුදලින් කළ යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. ප්‍රාදේශීය සභා බදු සඳහා 1% (සියයට එකයි),
3. සියලුම ප්‍රචාරක වියදම්,
4. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් (ගැණුම් මිලෙන් 2.5%),
5. විකුණුම් කොන්දේසි පිළියෙල කිරීමේ හා නොතාරිස් ගාස්තු,
6. ලිපිකරු හා සෝෂක ගාස්තු.

ගැණුම් මිලෙන් 90% ක් (සියයට අනූවක්), විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත දී හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී ආයතනයට ගෙවිය යුතු අතර එසේ ගෙවීමට අපොහොසත් වුවහොත් ඒ වන විට ගෙවා ඇති මුදල් ආපසු නොගෙවන අතර එම දේපළ නැවත වෙන්දේසියේ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු තිරප්පු පරීක්ෂාව සඳහා ජ්‍යෝෂ්ඨ කළමණාකරු (ණය අයකිරීම්) හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. අංක 479, ටී. බී ජායා මාවත, කොළඹ 10, දුරකථන අංක : 2661826, 2661835 ලබා ගත හැක.

හේමචන්ද්‍ර දළුවත්ත,
උසාවි කොමසාරිස් බලයලත් වෙන්දේසිකරු,
සහ තක්සේරුකරු.

අංක 99, උසාවිය පාර,
කොළඹ 12.
දුරකථන අංකය : 071-4175944
075-8489378

07-256

---

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී - කදාන ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. (ලියාපදිංචි අංක පී. කිව්. 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බලයලත් මානක එච්. එල්. සී. දාබරේරා විසින් 1985 අගෝස්තු මස 02 වැනි දින සාදන ලද අංක 4450/1985 දරන පිඹුර පරිදි බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ලියාපදිංචි කොට්ඨාසයේ දූනගහ පත්තු හෝ අළුත්කුරු කෝරළේ තිඹිරිගස්කටුව පිහිටි මහවත්ත කියන ඉඩමේ බෙදාවෙන් කරන ලද ලොට් 1 E 1 දරන

අක්කර එකයි රූඩ් දෙකක්
(අ. 1 රූ. 02 පර්. 0)

විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි, ගසකොළ වගාවන් සහ සියලු දේත් සමග වේ.

සිල්වරින් හෝම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු හැටියට ද එම දායකයා විසින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ට උකස් කරන ලද ඉහත සඳහන් කළ දේපළ 2011 ජූලි මස 28 වැනි දින පෙ. ව. 11.30 ට ඉහත ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2009.12.18 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2009.12.19 වැනි දින ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් බලන්න. විකිණීම පිළිබඳව දැන්වීම සඳහා 2011.07.08 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද සහ 2011.07.08 වැනි දින ලක්බිම සහ ද අයිලන්ඩ් පුවත්පත් බලන්න.

*ඉඩමට පිවිසීම.* - මීගමුව කොප්පරා හංදියේ සිට කටාන ගිරිඋල්ල පාරේ. කි. මී. 2.4ක් පමණ ගොස් වමට හැරී (ශාන්ත නිකලස් ජාත්‍යන්තර පාසැල ඉදිරිපිට) අඩි 25ක් පළල පාරේ මීටර් 125ක් පමණ ඉදිරියට ගිය විට අදාළ දේපළ හමුවේ.

*ගෙවීමේ ක්‍රමය.* - විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%),
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල ගැණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
4. නොතාරිස් ගාස්තුව රු. 2,000,
5. ලිපිකරු හා සෝෂක වේතනය රු. 500,
6. වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම්,
7. ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනුව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුල දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි ප්‍රධාන කාර්යාලයේ හෝ කදාන ශාඛාවේ තැන්පත් කළ යුතු ය.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, උසාවි කොමසාරිස්,
තක්සේරුකරු බලයලත් ජ්‍යෝෂ්ඨ වෙන්දේසිකරු.

අංක 99,
උසාවිය පාර,
කොළඹ 12

දුරකථන අංක : 011 3144520
දුරකථන/ෆැක්ස් අංකය : 011 2445393.

කළමනාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලොන් පී. එල්. සී,
අංක 41 ඩී,
මීගමුව පාර,
කදාන.

දුරකථන අංක : 011-5355369
011- 5332994
ෆැකැස් අංකය : 011 -2236013

07-228

---

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - බුත්තල ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

